# <u>වෘත්තීය සමිති ලියාපදිංචි කිරීමට ඉල්ලීම හා අදාල උපදෙස්</u>

<u>සාමාන්‍ය :</u>

- ❖ සංගමයේ ලියාපදිංචි කිරීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව 07කට වැඩිවිය යුතුය
- ❖ වෘත්තිය සංගමය පිහිටුවා මාස 03ක් ඉක්මවා යාමට පූර්ව ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතුය.
- ❖ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට එක්ව වෘත්තීය සමිතියක් පිහිටුවා ගත නොහැක.

<u>"B" ආකෘති පත්‍රය හා ව්‍යවස්ථා මාලාව.</u>

1.) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන "B" ආකෘති පත්‍රයේ හා ව්‍යවස්ථා මාලාවේ සම්පූර්ණ කරනු ලබන සෑම ස්ථානයකම ලේකම්වරයා විසින් කෙටි අත්සන් යෙදිය යුතු අතර සම ලේකම්වරු පත්ව ඇති අවස්ථාවන්හිදී සම ලේකම්වරුන් සියලු දෙනාගේම කෙටි අත්සන් යෙදිය යුතුය.

2.) (i.) ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය ("B" ආකෘතිය) සමග සමිතියේ ආරම්භක රැස්වීම් වාර්තාව සහ රැස්වීමට සහභාගී වූ සාමාජික අත්සන් නාම ලේඛණය ඉදිරිපත් කළ යුතුය.

(ii) එම අත්සන් ලේඛණයෙහි පහතින් දක්වා ඇති විස්තර පැහැදිලිව හා නිරවද්‍යව සඳහන් කර තිබිය යුතුය.

- ➢ සාමාජිකයාගේ නම
- ➢ ජාතික හැඳුනුම්පත් අංකය
- ➢ පෞද්ගලික ලිපිනය
- ➢ රක්ෂාව
- ➢ රාජකාරී ලිපිනය
- ➢ සේවක අංකය
- ➢ සේවක අර්ථ සාධක අරමුදල් අංක ඇත්නම් එම අංක
- ➢ පෞද්ගලික අංශයේ වෘත්තීය සමිතියක් නම්, එක් එක් සාමාජිකයාට අදාල සේවා යෝජකයාගේ විස්තර

3.) "B" ආකෘති පත්‍රයේ,

i. අදාල කොටසෙහි අවලංගු නොකල රු.5.00ක් වටිනා මුද්දර ඇලවිය යුතුය.

ii. ඉල්ලුම්කරුවන්ගේ අත්සන් යෙදිය යුතු ස්ථානයේ අදාල මහ සභා රැස්වීමට පැමිණ සිටි සාමාජිකයන් අතුරින් 07 දෙනෙකුගේ අත්සන් යෙදිය යුතු අතර ඔවුන්ගේ විස්තර (I) වැනි උප ලේඛණයේ (අ) කොටසෙහි සඳහන් කළ යුතුය.

iii. (I) වැනි උප ලේඛණයේ (ඉ) කොටස යටතේ සමිතියේ නිලධාරී මණ්ඩලයට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිනයන් සඳහන් කළ යුතුය.

4.) ව්‍යවස්ථා මාලාවේ අංක (06) (අ) හා (08) අනුව රැස්වීම්වලදී සංඝ පූර්ණය පැහැදිලිව සටහන් කළ යුතුය.

5.) ලියාපදිංචියෙන් පසු නිලධාරී වෙනස් වීම, වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම, ව්‍යවස්ථා වෙනස් කිරීම, කාර්යාල ලිපිනයේ වෙනස් කිරීම, විසුරුවා හැරීම හා ඒකාබද්ධ කිරීම යන කරුණු වලදී අවශ්‍ය වන අදාල ෆෝරමයන් මෙම අංශයෙන් ලබා ගත හැකි වේ.

<u>වැඩිදුර විස්තර සඳහා :</u>

| | | |
|---|---|---|
| දුරකතන අංකය | - | 0112369646 |
| ලිපිනය | - | සහකාර කම්කරු කොමසාරිස්,<br>වෘත්තීය සමිති අංශය,<br>7 වන මහල,<br>නාරාහේන්පිට,<br>කම්කරු දෙපාර්තමේන්තුව,<br>කොළඹ 05. |